## කවි කොළය

# කොටි රැළ රහත් වී බණ කියනවා ඇත!

සිංහල ලෙයින් හළ මේ මුළු රට සෝදා
**කරුණා** නමැති මේ බිහිසුණු **ගල්** ආඳා
මහ උවසුවෙකු මෙන් සිල් අරගත් පෝදා
ඇට වැල ගනී. නැත කිසිවෙකුගෙන් බාදා

මහ සඟරුවන පෙති ගසමින් දරුණු කමේ
සංකේතය බවට පත්වුණු සිහළ බිමේ
සැඟවී පජාතන්තරයෙහි බැටළු හමේ
වැජඹෙයි පිල්ලෙයානුත් මහ ඇමති කමේ

මුලදී තමිල් වෙල්වම් බාබර යාට
දුන් එක **-නේන ගම්** යන දඬුවම ඌට
සිත යොමු කළොත් දැන් දැන් සිදුවන දේට
සාදාරණ ද සැකයක් මතුවෙයි ඊට

කුමටද මදුරුවෙකු නැසුමට වෙඩි උණ්ඩ
නොතබා ඉඩක් ඔහු මිය පරලොව යන්ඩ
පවරා ඇමතිකම සංවර්ධන කොණ්ඩ
තිබුණා අහිංසකයාගෙන් වැඩ ගන්ඩ

කරමින් පජාතන්තරවාදයට ගරු
අවි බිම තබා ලේ වැගිරෙන අතෙහි දැරූ
පිරිබාහරන් ආවොත් අප නොසිතූ විරු
ඔහු දෙවියෙකැයි නමදිමු දිවි තිබෙන තුරු

මැරුවොත් එකෙකු අල්ලා ඌ මරපු එකා
නීතිය සිටී උගෙ දිවි ලනු පිණිස මකා
හත් අට දහක් ජීවිත ගිල දැමුව යකා
මහ වීරයෙකු වී පෙන්වයි අපට කොකා

හොම්බෙන් දුවන්නට වැදුණට පසුව බැටේ
දැන් යුද විරාමයකට කෙළ හලන කටේ
කැඳවා **නඩේසන්** නම් ගල් අඟුරු කැටේ
පවරමු පොලිස්පතිකම මුළු සිහළ රටේ

අංගුලිමාලයාටත් අපි
දුනිමු සමා
යනුවෙන් කියනු ඇසුවෙමි
දුටුගැමුණු තුමා
කොටි රැළ රහත්වී
අද හෙට නැතුව පමා
බණ කියනවා ඇත
ආයුධ පසෙක දමා



♦ **තලන්ගම ජයසිංහ**
**Sri Lanka**



# බුදුන්ට පිටුපස හැරවීම



**ඊ**යෙ **6.8.28** දිවයින පුවත් පතේ මුල් පිටුවේ පළවී ඇති භික්ෂූන් වහන්සේලාගේ හා අගරදගුරුතුමන්ගේ ඡායාරූපය දැක මෙය ලියා එවමි. පින්තූරයේ පෙනී සිටින සියළු දෙනා සිටින්නේ අප බුදුරජානන් වහන්සේට පසුපස හරවාගෙනය. අද මේ රටේ සිටින බෞද්ධ කුඩා දරුවෙකු වුවද ඡායාරූපයකට පෙනී සිටින විට බුදු රජාණන් වහන්සේට පිටුපා ඡායාරූප වලට පෙනී සිටින්නේ නැති බව කවුරුත් දන්නා කරුණකි. අගරදගුරුතුමන්ලා සහ තානාපති තුමන්ලා මේ කරුණු නොදන්නවා ඇත. ඒ නිසා බුදුරදුන්ට පිටුපා ඡායාරූපයට මුහුණ දෙන්නට ඇත. එහෙත් මේ රටේ සිටින මහානායක, අනුනායක, මහාචාර්ය භික්ෂූන් වහන්සේලා බුදුරදුන්ට මෙසේ පිටුපස පෑම සැදැහැවත් බෞද්ධ පිංවතුන්ගේ සංවේගයට හේතුවෙයි.

♦ **දයාවංශ ජයකොඩි කොළඹ 10**

## කොළඹ විත්ති




**මර්වින් ඇමතියෙක්ද? මැරයෙක්ද?**
හිටපු ඇමති මංගල සමරවීර මහතා උද්ඝෝෂණයේ යෙදී

# මර්වින් සිල්වාට කොළඹ උද්ඝෝෂණ

**මර්වින් නමැති පිස්සු බල්ලා බැඳ දමනු** යන්න ගිය සතියේ කම්කරු ඇමති මර්වින් සිල්වාට එරෙහිව කොළඹ පැවති දැවැන්ත උද්ඝෝෂණයේදී නැගුණු එක් වගන්තියකි.

දැනට දින කීපයකට පෙර පාලමක් විවෘතකරන උත්සවයකදී එහි ඡායාරූප ගැනීමට පැමිණි සිරස රූපවාහිනියේ කැමරාකරුවෙකුගේ කැමරාව උදුරා කඩා දමන්නට තැත්කිරීමත්, ඔහුට පහරදීමත්, ඇමති මර්වින් සිල්වාට එරෙහිව නැගුණු ජනතා හඬට හේතුව වෙයි. මෙයට පෙර කීප වතාවක්ම මාධ්‍යවේදීන්ට පහරදීම් හා අසභ්‍ය වචනයෙන් බැනවැදීම් සම්බන්ධයෙන් මර්වින්ට විරුද්ධව කොළඹ උද්ඝෝෂණ පවත්වා ඇත.

පක්ෂය ද, ගුරුවරුන්ගේ ඒකාබද්ධ සංගමයද, විවිධ මාධ්‍ය සංවිධානද මෙම උද්ඝෝෂණයට සහභාගිවී සිටියහ. ඔවුන් අතර මංගල සමරවීර, තිස්ස අත්තනායක, වික්‍රමබාහු කරුණාරත්න, රවී ජයසූරිය ජයලත් ජයවර්ධන ආදී ප්‍රමුඛ පෙළේ අයද විරෝධ පාඨ කියමින් සහයෝගය දක්වනු පෙනිණ.

මර්වින් සිල්වාට එරෙහිව මුළු මහත් ශ්‍රීලංකාවේ බොහෝ දෙනා හඬ නගති. ඔහු මැරවර බලය පාන්නට ගොස් මේ නොබෝදා රූපවාහිනියේ වැඩකරන අයගෙන් මුහුණෙන් ඔළුවෙන් ගේ ගලන තුරු ගුටි කෑවේය. එහෙත් මර්වින් තම අශෝභන ගති අත්හැර නැත. ඔහු රජයට මහා අපකීර්තියක් බව දැන් මුළු රටේම මතය වී ඇත..



**ඉරිදා**- අපි කවුරුත් දන්නවා ලංකාවෙ බඩු මිළ මිනිස්-
**SUN** සුන්ට දරන්න තරම් වැඩිවෙලා බව. ඒ සේරම තෙල් වැඩි වීමෙ ප්‍රශ්නෙ උඩ. මේක දැන් මුළු ලෝකෙටම බලපාන්න පටන් අරන්. මෙහේ පැට්‍රල් ගැලුමක් දැන් පවුම් 5 කටත් වැඩියි. ඩීසල් ඊටත් වැඩියි. අද මම සේන්ස්බරියෙන් බඩු ගේන්න ගිය වෙලාවෙ තමයි මට හරියටම තේරුණේ හැම දේම ගණන් ගිහිං බව. වෙනද අපේ නිහාල් ගෙදරට බඩුගේන නිසා මට ඒක ටිකක්වත් තේරුණේ නෑ. පැට්‍රල් වැඩි වීම දරන්න බැරිවුණාට, ආහාර වල මිළ වැඩිවුනාට මෙහේ මිනිස්සු වචනයක් කටඇරලා කියන්නෙ නෑ. කරබාගෙන ගොළුවො වගේ ඉන්නවා. ලංකාවෙ නම් මෙලහකට ස්ට්‍රයික්, පෙළපාලි, උද්ඝෝෂණ, කෑගැහිලි කොච්චර සිද්ධ වේද? මට පුදුම හිතෙනවා මේ යුරෝපයේ මිනිස්සුන්ගෙ ඉවසීම ගැන.

**සඳුදා** - දැන් ලංකාවෙ පත්තර වලින් නිතරම කරන බූරු
**MON** වැඩක් තමයි කොහේ හරි බෝම්බයක් පිපිරුණාම පොලීසියෙ ලොක්කෙක් ඉන්ටර්වීව් කරලා අහනවා, මේ ත්‍රස්තවාදීන් අල්ලන්න පොලීසිය ගන්න ක්‍රියා මාර්ගය මොකක්ද කියලා. ඒ පාර පොලිස් නිලධාරියා විස්තර කරනවා, ත්‍රස්තවාදියා මෙන්න මෙහෙම කරන්න හැදුවා, ඊළඟට මෙන්න මේවගේ දෙයක් කරාවි, අපි මෙන්න මෙහෙම කරන්න හිතාගෙන ඉන්නවා, ආදි වශයෙන්. පොලීසියෙ ප්ලෑන් එක සේරම පත්තරේට එළිකරනවා. පත්තරකාරයත් ඒවා එදාම ප්‍රසිද්ධකරනවා. ඊට පස්සෙ කොටියා වැඩ කරන්නෙ වෙන විදියකට. මොකටද කරන්න යන දේවල් පත්තරවලට කියන්නෙ? පොලීසියට මොලයක් නැද්ද? මහදැනමුත්තයි ගෝලයො ටිකයි පොලීසියට බන්දගත්තනම් හොඳයි කියලා හිතෙනවා.

**කුජදා** - දැන් මේ දවස්වල ඉන්ටර්නෙට් එකේ විවාදයක්
**TUE** යනවා ප්‍රභාකරන් ඇල්ලුවම මොනව කරනවද යන එක ගැන. (තාම ඌ අල්ලලත් නෑ. ඇත්තටම ඕකා ඉන්නවද දන්නෙත් නෑ.) කවුද කියලා තිබුණා කන්තලේ උක්ගස් හිටවන්න මැන් දාන්න කියලා. සමහරු යෝජනා කරනවා දෙහිවල සත්ව උද්‍යානෙ කූඩුවක දාලා ටුවරිස්ට්ලට පෙන්නලා හොඳ ආදායමක් හොයාගන්න පුළුවන්ය, මැරුවොත් ඒව කරන්න ලැබෙන්නෙ නැත කියලා. ඕස්ට්‍රේලියාවෙ කෙනෙක් යෝජනා කරනවා කිඹුල්ලු ඉන්න වළකට උඩින් ප්‍රභාකරන් පණපිටින් ලණුවකින් එල්ලලා, කිඹුලගෙ හොස්ස ළඟටම පහත් කරලා, ආයි උස්සන්න කියලා. එහෙම දවසට සිය සැරයක් විතර දිගටම මාසයක් කරන්නලු. ඒකනම් හොඳයි

**බුදදා**- 1983 ජූලි මාසෙ ලංකාවෙ වුණු ජාතිවාදි කෝල
**WED** හල හන්දා කොටියි, පිටරට ඉන්න දෙමළ ප්‍රජාවයි හැම අවුරුද්දෙම ජූලි මාසෙ කලු ජූලිය කියලා එකක් සමරණවා. ඒ විදියට ගත්තොත් ලංකාවෙ කලු ජනවාරි, කලු පෙබරවාරි, කලු මාර්තු ආදි විදියට හැම මාසෙම මුලට කලු දාලා සමරන්න අපිටත් ඇහැකි. ඇයි කොටි ඔය හැම මාසෙකම මිනිස් ඝාතන කරලා තියනවා නේ. හාමුදුරුවරු මැරුවා. ශ්‍රීමහාබෝධිය ළඟ සිල් ඇත්තො මැරුවා. දළදා මාළිගාවට බෝම්බ ගැහුවා. ඇයි කවුරුවත් ඒ ගැන කතාකරන්නෙ නැත්තෙ? උන් තාමත් මිනීමරණවා. ඇයි ජූලි මාසෙ විතරක් කලු වෙන්නෙ? අනික් මාසවල දිගටම උන් මරපුවා සුදුද?

**ගුරුදා** - කොළඹ තියෙන ඇපලෝවගේ ප්‍රයිවට් ඉස්පිරි-
**THU** තාල ලක්ෂ ගණන් අයකරලත් කරන්නෙ බොරුව කියලා ආතර් මාම කියනවා. ඒකෙ ඉන්න සමහර දොස්තරලා විශේෂඥයො කියලා පෙන්නුවට දොස්තර කමට සුදුසු නෑ කියලා ඉන්දියානු රජයෙ වෛද්‍ය මණ්ඩලයෙන් පන්නලා දාපු අය. ලංකාවට ඇවිල්ලා රටේ මිනිස්සුන්ගෙ සල්ලි ටික හූරගන්නවා. ඇයි අපේ ආණ්ඩුවට බැරි ආණ්ඩුවෙ ඉස්පිරිතාල දියුණු කරලා ගන්න? ඇයි ඇපලෝකාරයින්ට ජනතාව හූරගෙන කන්න දෙන්නෙ? කෝ අපේ රටේ සෞඛ්‍ය ඇමති ?

**කිවිදා** - සාක් සමුළුව ලංකාවෙ හරි ජයට පැවැත්වුණු බව
**FRI** තිබුණා. ඒක හොඳයි. ඒවුණාට ඒකෙ කටවුට් ගැහිල්ල බාරදීලා තියෙන්නෙ අර රූපවාහිනියෙන් ගුටි කාපු මර්වින් සිල්වට. මැන් සාක් සමුළුවෙ කටවුට් පෝස්ටර් වල එයාගෙ පොටෝ එකත් අන්දවලා දාලා. ඒ මදිවට එක බෝඩ් එකක තියෙනවා 18 වෙනි සමුළුව කියලා. තවඑකක ලියලා තිබුණා 21වෙනි සාක් උළෙල කියලා. තව එකක තිබුණා 27 වන සාක් සමුළුව කියලා. ඒ කියන්නෙ සාක් සමුළුව තිබුණට ලංකාවෙ කවුරුවත් තවම දන්නෙ නෑ ඒ කීවෙනි සමුළුවද කියලා.

**ශනිදා**- ඊයෙ චීනෙ බේජිං නුවර ඔලිම්පික් උළෙල පටන්
**SAT** ගත්තා. පුදුම ලස්සනක්. ඒ අලංකාරය ඔලිම්පික් වලට දෙන්න ආයිත් මේ සම්ම ජාතියෙදි තව රටකට පුළුවන් කියලා මම නම් හිතන්නෙ නෑ. චීනෙ ගැන හිතේ කිසියම් අසතුටක් කෙනෙකුගෙ තිබුණ නම්, ඒ උත්සවෙන් ඒ සේරම මැකිලා යනවා. ෂහ් එහෙම සුන්දරත්වයක්! ලබන ඔලිම්පික් වාරය එංගලන්තයට. මං හිතන්නෙ නෑ චීනෙට අලගු තියන්නවත් මෙහාට පුළුවන් කියලා.